ශ්‍රී. බු. ව. 2558 ක්වූ ඇසළ මස කලාපය, රාජ්‍ය වර්ෂ 2014 ක් වූ ජුලි මස 12 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති

ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

උප්පත්තියට හේතුවන සම්පත්ති සහ විපත්ති

( අඞගුතතර නිකාය - සම්පද සූත්‍රය ඇසුරිනි)




ධර්මකාමී පින්වතුනි,

අද ශ්‍රී ශුද්ධ බුද්ධ පරිනිර්වාණ වර්ෂ 2558 ක් වූ ඇසළ මස පුර පසළොස්වක පොහෝ දිනයයි. රාජ්‍ය වර්ෂ 2014 ක්වූ ජුලි මස 12 වන දිනට යෙදුනු පුරපෝ දිනයයි.

සිදුහත් කුමරුන් මවුකුස පිළිසිඳ ගැනීම, ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීම, කොණ්ඩඤ්ඤ තාපසතුමා සෝවාන් වීම, භික්ෂු සංඝයා වහන්සේලා පෙරවස් එළඹීම. රාහුල කුමරුගේ උපත, ලක්දිව අරිට්ඨ කුමරු ප්‍රමුඛ

සිංහලයන් 56 දෙනෙකු මහණ උපසම්පදාව ලැබීම, සියම් රටින් උපාලි හිමියන් ප්‍රධාන සංඝයා වහන්සේ වැඩමවා යලිත් ලක්දිව උපසම්පදාව පිහිටුවීම, වැනි උතුම් ශාසනික වටිනාකමක් ඇති සිද්ධීන් සිහිපත් කරන දිනයකි.

අද මෙම දහම් පණිවුඩයට මාතෘකා වශයෙන් යොදා ගත්තේ සූත්‍ර පිටකයෙහි අංගුත්තර නිකායේ පංචක නිපාතයේ සඳහන් ''සම්පදා සූත්‍රය''යි. මෙය භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන විහාරයෙහි වැඩ වසන දිනක දේසනා කරන ලද සූත්‍රයකි.

තථාගතයන් වහන්සේ භික්ෂූන් වහන්සේ අමතා ''පඤ්චිමානි භිකඛවෙ ඛ්‍යසනානි'' ''මහණෙනි විපත්ති පහකි.'' ඒ විපත්ති පහනම්

ඥාති ව්‍යසනය

ක භෝග ව්‍යසනය

ක රෝග ව්‍යසනය

ක ශීල ව්‍යසනය

I දෘශ්ධි ව්‍යසනයයි.

“පඤ්චිමා භික්ඛවේ සමපදා” මහණෙනි සම්පත්ති පහකි. එනම් ක ඤාති සම්පත්ති කභෝග සම්පත්ති ක නිරෝගි සම්පත්ති ක ශීල සම්පත්ති ක දෘශ්ධි සම්පත්තිය.

තථාගතයන් වහන්සේ ඊළඟට මේ විපත්ති පහ සහ සම්පත්ති පහ පිළිබඳව විශේෂ ධර්ම න්‍යායක් ඉදිරිපත් කරනව. මහණෙනි, සත්වයන් ඤාති විපත්තිය, භෝග විපත්තිය, රෝග විපත්තිය හේතුවෙන් ඔවුන් මරණින් පස්සෙ දුගති උප්පැත්ති නොලබයි. ශීල විපත්තිය දෘශ්ධි විපත්තිය නිසා මරණින් මතු දුගතියේ උප්පැත්තිය ලබනව. මේ විපත්ති පහේ ස්වභාවයකි.

මහණෙනි ඤාති සම්පත්තිය, භෝග සම්පත්තිය, නිරෝගී සම්පත්තිය, හේතුකොට ඒවා තිබුන නිසාම සත්වයා මරණින් මතු සුගතියට නොපැමිණේ. එනමුත් ශීල සම්පත්තිය දෘශ්ධි සම්පත්තිය නිසා මරණින් මතු සුගතියට යෑමට සත්වයාට ඒ සම්පත්ති දෙක හේතු වනවාය. මහණෙනි මේ සම්පත්ති පහේ ස්වභාවයකි.

ඤාති ව්‍යසනය (විපත්ති හෙවත් විනාශය) යනු උපන් සත්වයා සමග ජීවත් වන ඤාතීන්ගේ විනාශය වීමයි. ඤාතිත්වය, පරම්පරානුගතව, ආවාහ විවාහ නිසා,

විශ්වාසය නිසා ඇතිවේ. එම ඥාතීන්ගේ නැතිවීම, විවිධ ආකාරයෙන් විය හැකිය. ඒ ඥාති විපත්තිය මතු භවයට හේතු නොවේ. මෙලොවට දුකකි. ඥාති සම්පත්තිය යනු ඉහත කී විනාශයේ අනිත් පැත්තයි. එනම් සම්පත්තියයි. ඥාතීන් ඇතිවීමයි. සහපිරිවරින් ලැබීමයි. එය සැපයකි. එනමුත් ඒ සම්පතද භවගාමී ගමනට හේතුවක් නොවේ. මෙලොවට සැපයකි.

භෝග විපත්තිය යනු සත්ව ජීවිත පැවැත්ම සඳහා භාවිතා කරන ධන ධාන්‍ය ගේ දොර යාන වාහන ආදී වූ සම්පත්තීන්ගේ පිරිහීමයි. නැතිවීමයි. විනාශයයි. එම භෝග විපත්තිය මතු දුගතිගාමී වීමට හේතුවක් නොවේ. මෙලොව දුකට හේතුවේ. භෝග සම්පත්තියද කොපමණ තිබුණත් සුගතිගාමී වීමට හේතුවක් නොවේ. මෙලොව සැපයට හේතුවේ.

රෝග විපත්තිය යනු සත්ව ජීවිත රෝග පීඩාවන්ට ගොදුරු වීමයි. එනමුත් එම රෝග විපත්තිය සත්වයාට මරණින් මතු දුගතියට හේතු නොවේ. මෙලොවට දුකකි. නිරෝගී සම්පත්තිය යනු සත්වයාගේ කායික සහ මානසික යහපත් කමයි. මෙලොවට සැපයකි. ඒ නීරෝගි භාවය නිසා එම සත්වයා සුගතියෙහි උපතක් ලබා දීමටද හේතු නොවේ. සම්පත් සහ විපත් පහෙන් ඉතිරි විපත්ති දෙක සහ සම්පත්ති දෙක සත්වයා මරණින් මතු දුගති සහ

සුගති යට පැමිණීමට හේතු වන බව දැක්වෙනව. එනම් යම් සත්ව කෙනෙකු සීලයෙන් පිරිහේද දෘෂ්ඨියෙන් හෙවත් දැක්මෙන් ඇදහීමෙන් පිරිහේද ඔහු දුක් සහිත වූ නිරය ආදී ස්ථානයන්හි ඉපදීමට හේතු වේ. සම්පත්ති පහෙන් ඉතිරි සම්පත්ති දෙක වන සීල සම්පත්තියෙන් සහ දෘශ්ඨි සම්පත්තියෙන් යුතු නම් යම් සත්ව කෙනෙකු දිව්‍ය මනුෂ්‍ය බ්‍රහ්මාදී සුගති සම්පත්තිය ලබා දීමට හේතුවේ යනුවෙන් සූත්‍ර පාළියේ සඳහන් වේ.

මනුෂ්‍යයින් වශයෙන් අපි රැයක් දහවලක් නැතිව වෙහෙසවෙන්නෙ කුමක් සඳහාද? තමන්ගේ සහ ඤාති හිතමිත්‍රාදීන්ගේ සම්පත්තිය තවතවත් වැඩි දියුණු කරගන්නත් ඤාති හිතමිත්‍රාදීන්ගේ විපත්ති වලක්වා ගන්නත් ලෙඩ දුක් නැතිව නිරෝගී වෙන්නත් ඒ නිරෝගීකම විනාශ වන්නට නොදී පවත්වන්නත්ය. 3ක් නැතිකරගන්නත් 3ක් රැකගන්නත් ගන්නා උත්සාහයයි. ඒ අපේ දිවි පැවැත්මයි. අපේ උත්සාහය භව ගමනට සෘජුවම බලපෑම ඇතිවන ඉතිරි සම්පත් දෙක සහ විපත්ති දෙක ගැන නොවේ.

අද වාගෙ ඇසළ පෝ දිනක බරණැස ඉසිපතනෙ මිගදායෙ නිසල පරිසරයේ වැඩ සිට දස දහස් ගණනින් දෙව් දේවතා සාධු නාද පවත්වද්දි පංච වාර්ගික භික්ෂූන් වහන්සේ අමතා "මහණෙනි කවර නම් මධ්‍යම

ප්‍රතිපත්තියක් ඇස හෙවත් ප්‍රඥාව ඇතිකරයිද, ඤාණය ඇතිකරයිද, නුවණැස මතුකරයිද, කෙළෙස් දාහය, නිවයිද, සත්‍ය ඇතිකරයිද අවබෝධය සඳහා නිවන සඳහා පවතීද? ඒ මේ ආර්‍යය අංග අට පමණි. සම්මා දිට්ඨි ………" යනාදී වශයෙන් තවත් කිසිවෙකුට නොපැවැත්විය හැකි එහෙත් තථාගතයන් වහන්සේ නමකට පමණක් පැවැත්විය හැකි ධර්ම චක්‍රය තුළින් ඉහත කී ගැටළුවට පිළිතුරු ලබා දුන් සේක.

අපේ ජීවිතයට විපත්ති සහ සම්පත්ති නිතරම ලැබෙනව. ඒ අටලෝ දහමයි. ඒවා අපේ කැමැත්ත ඇතත් නැතත් අප කරා පැමිණේ. අපේ සංවරකම සහ අවබෝධය ඇතිව ඒවාට මුහුණ දෙනවානම් ඒ හේතුකොට මරණින් මතු දුගති හේතු සකස් නොවේ. සුගති ගාමී හේතු සකස් වේ. තථාගතයන් වහන්සේ සීලය සහ දෘෂ්ඨිය භවගාමී ගමනට හේතුවෙනවා යයි වදාළේ ඒ නිසයි.

ලෝකයේ සත්වයා කවදත් අවිද්‍යා අන්ධකාරයේ ගමන් කරනව. ඒ නිසා සත්‍ය දකින්න බැහැ. මේ සම්පදා සූත්‍රයේ දැක්වෙන විපත්ති සහ සම්පත්ති පහෙන් මුලට යෙදී ඇති විපත්ති තුනෙන් මිදීමටත් සම්පත්ති තුන වර්ධනය කරගැනීමටත් අපි කොතරම් වෙහෙසෙනවාද? ඒ කොතරම් වෙහෙස වුවද ඒවා තාවකාලික සුවයන්ය.

සීල සහ දෘෂ්ඨි සම්පත ඉතා පහසුවෙන් නොමිලයේ ඇතිකරගත හැකි සම්පත් දෙකකි. ඒ සම්පත්තිය මේ ආත්මයට පමණක් නෙවි. මතු භවයටද නිවනටද හේතු වන බව අප දැන ගත යුතුයි.

සීලය යනු හික්මීමයි. ප්‍රාණ ඝාතාදී වැරදි ක්‍රියාවන්ගෙන් වැලකී තම තමන්ට පැවරෙන දැහැමි සාධාරණ යුතුකම් ආදී වත් පිළිවෙත් පුරන විට ඒ ඒ අවස්ථාවන් වලදී ඇතිවන චේතනාදී ධර්‍මයෝ ශීල නම්වේ. ඒ මගින් සම්මා වායාමය සකස් වේ. ලෝකයේ ඉන්නා තරම් මිනිසුන් ශිෂ්ඨ සහ අශිෂ්ඨ වශයෙන් කොටස් දෙකකට ඉබේටම බෙදේ. එයින් අශිෂ්ඨයා සමාජයට කරදරයකි. ශිෂ්ඨයා සමාජයට ශාන්තියකි. ඔහු ශිලවන්තයෙකි. රටක් පාලනය වන්නේ නීතියෙනි. ඒ වාගේම මිනිස් සමාජය පාලනය වන්නේ ශීලය නැමැති නීතියෙනි. ඒ නිසා රටක නීති කඩන්නා උසස් පහත් භේදයෙන් තොරව අපරාධකාරයාය. සමාජයක සිල් බිඳින්නාද ගිහි පැවිදි භේදයෙන් තොරව අපරාධකාරයෙකි. බෞද්ධයන්ගේ පරමාර්ථය හෙවත් දැක්ම කෙලෙසුන් නසා සසරින් මිදීමටය. එය එකවරට කළ නොහැකිය. කෙලෙස් තැවීම සීලයෙන් සිදුවේ. එවිට කවදා හෝ සියලු කෙලෙස් නැසීමට පහසුවේ.

බෞද්ධයෝ ඕනෑම පිනක්, දහමක්, දනක්, බණක්, මතක වස්ත්‍ර පිදීමක්, සමිති සමාගමක්, ආරම්භයේදී අඩුතරමින් පංච ශිලයෙහිවත් පිහිටන්නේ කිනම් හේතුවකටද? සීලයේ සහ දෘශ්ඨියේ නොපිහිටා අහස උසට දන් දුන්නත් කුමන පිංකම් කළත් සුගතිගාමී වීමට බැරි නිසාය. එතැන ශීලයත් දෘශ්ඨියත් නැත. ඒ නිසා ඉහතකී ආයර්‍ය මාර්‍ග අටෙහි පිහිටා සීලය සහ දෘශ්ඨි සම්පත් ඇතිකරගත යුතුය. එවැනි පුද්ගලයෙකුට මරණින් මතු ඇති අනතුරුදායක තත්වයෙන් මිදීමට හැකිවනු ඇත. ඊට හොඳම උදාහරණය ඇතැම් මනුෂ්‍යයින්ට ද, ලැබෙන්නේ නැති ආහාර, වස්ත්‍ර, යානවාහන, ඇඳ පුටු, බෙහෙත් සහ සාත්තු සේවකයින් ආදී උපභෝග පරිභෝග සම්පත් වලින් යුතු සුනඛයින් අලි ඇතුන් ආදී සතුන් කොපමණ ලෝකයේ ඇත්ද ඒ සතුන් මොන සම්පත් ලැබුවත් ශීල සම්පත් සහ දෘශ්ඨි සම්පත් හේතුකොට ලැබිය යුතු සුගති ගාමීකම නැති නිසා තිරිසන් යෝනියෙහි ඉපිද ඒ දුක් විඳී. ඒ දැක ඇතැම් මනුෂ්‍යයින් කියන්නේ අසවල් තැන බල්ලෙක් වී උපන්නත් හොඳයි කියාය. එසේ සිතීම පවා උතුම් මනුෂ්‍යකමට නිගාවකි. ඔවුන් ලඟ ඇත්තේ සීලය සහ යහපත් දැකීමක් නොව තිරිසනුත් ලබන සිව්පසයට ඇති කෑදරකමය.

දෘශ්ඨි සම්පත්තිය යනු තමන්ගේ සිත තුළ පවතින නිවැරදි දැක්මයි. නිවැරදි පිහිටීමයි. නිවැරදි ඇදහීමයි. එය දියුණුවටම පත්කර ගැනීම මතු කිසිදා වෙනස් නොවන තැනට පත්කර ගැනීමට මමය මාගේය යන හැඟීම නැති කිරීම දක්වා වීයෑී කළ යුතුය. ඒ තුළ පිහිටා කටයුතු සම්පාදනය කරගන්නා සසරින් ජයගන්නවාමය. ඒ ජය ලැබිය හැකිවන්නේ මේ තථාගත ශ්‍රී සද්ධර්මයෙන්මය. සද්ධර්මය සැබෑවටම ඇසුරු කරන්නාට සීලය සහ නිවැරදි දෘශ්ඨිය ඇති කරයි.

භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන ලද සූත්‍රයක් තියෙනව. ''සබ්බාසව සූත්‍රය'' කියල එහි සඳහන් වෙනව. අපේ සිතේ අනන්ත සසරේ පටන් පැනනගිමින් පවතින කෙලෙස්, දුරුකිරීමේ මාගී හෙවත් වැඩපිළිවෙල හතක් එහි පළමු කාරණය වන්නේ දර්ශණයෙන් හෙවත් දෘෂ්ඨිය නිවැරදි කරගැනීමෙන් දුරු කළ යුතු කෙළෙස් තියෙන බවයි. ඒ අපේ මාතෘකාවයි. දර්ශණය යනු දෘෂ්ඨි සම්පත ඇතිකරගැනීමයි. සච්චවිභඩග සූත්‍රයේදී ''කතමඤ්චාවුසො සමමා දිට්ඨි ? (ඇවැත්නි සම්මා දිටඨිය කුමක්ද?) දුකෙඛ ඤාණං (දුකක් බව දැනගැනේද) දුක්ඛ සමුදයේ ඤාණං (දුක ඇතිවීමට හේතුව දැනගැනීම) දුක්ඛ නිරෝධෙ ඤාණං (මෙසේ දුක නැති වීමය යන දැනුම) දුක්ඛ නිරෝධ ගාමිණියා පටිපදාය ඤාණං (දුක් දුරුකිරීමේ

ක්‍රමවේදයේ දැනුම) මේ ආර්‍ය්‍ය සත්‍ය සතරයි එය සසර දුක සහමුලින් නැත්තටම නැතිකිරීමේ ක්‍රමවේදයයි ඉන් මෙහාද ලොව ඕනෑම ක්‍රියාවකටම සතර දහමක් තිබෙනව. උදාහරණ ලෙස දුප්පත්කම ගනිමු.

ක දුප්පත්කම ඇතිබව එය දුකක් බව දැන ගන්නව (දුක්ඛ ඤාණය)

ක දුප්පත්කම ඇතිවීමට හේතුව දැන ගන්නව (සමුදය ඤාණය)

ක දුප්පත්කම නැතිකල යුතු බව දැන ගන්නව (නිරෝධ ඤාණය)

ක දුප්පත්කම නැතිකිරීමේ පිළිවෙත දැන ගන්නව (මාර්ග ඤාණය) ඔහු දුප්පත්කම නැමැති දුකෙන් මිදෙනව.

දැන් මේ සූත්‍රයට අනුව සීල සම්පත්තිය සහ දෘෂ්ඨි සම්පත්තිය අපි විසින් සකස් කර ගෙනද කියලා බලමු. සකස් කර ගත්තේ නම් එවිට කලින් කියනලද ඤාති විපත්ති, භෝග විපත්ති, රෝග විපත්ති ඇති නොවීමටද ඤාති සම්පත්ති, භෝග සම්පත්ති, නිරෝගි සම්පත්ති ඇති වීමේ පසුබිමද දැකගන්න හැකිවෙනව. නැතිනම් විපත්ති ඇතිවූ විට කොඩිවින අනවින, ඇස්වහ කටවහ, ග්‍රහ අපල, දෙවි දෝෂ, භූත දෝෂ නිසා මේවා සිදුවුනා යැයි දුක්වෙනව. ශ්‍රමය ධනය වියදම් කරගැනීම පමණක් ම

නෙවි. බුදුරජාණන් වහන්සේ මේ සූත්‍රයෙන් පෙන්වා දෙන පරිදි දුගතියට යෑමටද සිදුවෙනව. අපට අද සිදුවී තිබෙන්නේ බණ පොතට අනුව අපේ ජීවිත අවංකව සකස් කර ගැනීමට උත්සාහ නොගැනීමයි. බුදුරජාණන් වහන්සේ අපිට උපදෙස් දී තිබෙන පරිදි කටයුතු කිරීමට බිය විය යුතු නොවේ. කිසිදු ඒ මග තුල අනතුරු නැත. එවිට විපත්ති දුරුකර සම්පත්ති උදාකර ගත හැකිවේ.

සූත්‍ර පිටකයේ සංයුත්ත නිකායේ ''ආණි සූත්‍රය'' නමින් දැක්වෙන සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ වදාරණව. ''මහණෙනි ඉහතදී සිදුවූවක් කියමි. ක්ෂත්‍රියන්ට අයිති ආණක නම් බෙරයක් විය. ඒ බෙර කඳ පැලුණු කල්හි ඒ සඳහා වෙනත් ඇණයක් ගැසූහ. ඒ ආකාරයට කලක් ගතවෙන විට ඇණගැසීම නිසා ඒ පැරණි බෙර කඳ අතුරුදහන් වී ඇණ සැලකිල්ලක් ඉතිරි විය. මහණෙනි ඒ පරිදි ඉදිරි කාලයෙහි තථාගතයන් වහන්සේ වදාරන ලද ගැඹුරු වූ අර්ථ ඇති ලොව්තුරා අර්ථ දක්වන ගැඹුරු ධර්මයන් දේශනා කිරීමට සහ ඒවා ඇසීමට මනුෂ්‍යයෝ කැමති නොවේ. කවියන් විසින් කරන ලද විසිතුරු අකුරු සහ අර්ථ ඇති යමක් වේද වෙනත් ශාසන වල උගැන්වෙන ගීත සූත්‍ර වේද ඒවා අසන්නට මනුෂ්‍යයෝ කැමති වෙති. ඒ පරිද්දෙන් බෙරකඳ අතුරුදන්වී ඇණ සැකිල්ල ඉතුරු වුනා සේ වෙනත් දේ නිසා සද්ධර්මයද

අතුරුදන්වන බව එම සූත්‍රයේ දේශනා කොට ඇත. ඒ අනුව තවදුරටත් උන්වහන්සේ අවවාද කරන්නේ තථාගතයන් වහන්සේගේ ගැඹුරු අරුත් ඇති ධර්මය අසන්න කැමැත්ත ඇතිකරගන්න, කන් යොමුකරන්න, අවබෝධය පිනිස සිත එළවන්න, ඒ දහමම උගත යුතුයි ද ඒ අනුව හික්මෙන්න ද යනුවෙනි. එවිට සීල සම්පත්තිය දෘෂ්ඨි සම්පත්තිය ශ්‍රාවක සිත් තුළ උපදී. ඥාති, භෝග, රෝග, විපත්ති වලින් නිවන් දකිනතුරු මිදීමට ඒවා සම්පත්ති බවට පත්කරගැනීමට සීල සම්පත්තිය දෘෂ්ඨි සම්පත්තිය ඇතිකර ගත යුතුය. සීල විපත්තිය දෘෂ්ඨි විපත්තිය ඇතිනොකර ගත යුතුයි. මෙවැනි දහම් පත්‍රිකාවකින් අද ඇති වී තිබෙන ව්‍යසන පිළිබඳව දැක්විය නොහැකිය. එදා ඇසළ පෝදා තථාගතයන් වහන්සේ වැයූ අමා බෙරය වෙනුවට අද එක්තරා විදියක ඇණ බෙරයක් වයන ආකාරයක් දැන් දැන් ඇතැම් කාරණා තුළින් දැකිය හැකිය. අළුත් ලොව්තුරා ශාසනයක් නැවත ඇති කළ නොහැකිය. පවතින ශාසනයේ ධර්ම විනය සිව් පිරිස විසින්ම ආරක්ෂා කළ යුතුය. එවිට තථාගත ශාසනය ආරක්ෂා වීමත් සසරින් එතෙර වීමත් සිදුවේ.

අද ලෝකයේ මනුෂ්‍යයින් අතර සීල විපත්තිය දෘෂ්ඨි විපත්තිය බලවත් ලෙසට ඇතිවීම නිසා විවිධ ගැටලු බොහෝ පැන නැගී ඇති බව පැහැදිළි වෙනවා. ඒ නිසා

**දෘශ්ධි සම්පත්තියත් සීල සම්පත්තියත් ඇතිකරගෙන අපායගාමී කර්ම වලින් වැළකී නියත සම්මා දිට්ඨීය හෙවත් දර්ශන සම්පත්තිය උදාකරගෙන මිත්‍යා බහු බුද්ධි වලින් වෙන්ව මෙලොව විපත් සහ සසර දුක් කෙළවර කරගැනීමට මේ ඇසළ පෝදා අධිෂ්ඨාන කරගමු.**